සබරගමුව පළාත් සභාව - சப்பிரகமுவ மாகாண சபை - Sabaragamuwa Provincial Council

**අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

கல்வி தகவல் தொழில் நுட்பம் மற்றும் கலாசார நடவடிக்கைகளுக்கான அமைச்சு

Ministry Of Education, Information Technology & Cultural Affairs

Email||:edusabaram@gmail.com Facebook||:SabEducationMinistry

මගේ අංකය / எனது இல / My Number: ME/E/2(සබර/චක්‍රලේඛ)

ඔබේ අංකය / உமது இல / Your Numbe

දිනය / திகதி / Date: 2014.03. 20 .

**පළාත් අධ්‍යාපන චක්‍රලේඛ අංක**
**: සබර/2014/14**

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,
අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු,
කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂවරු,
සියළුම විෂයභාර සහකාර / නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරු,
ප්‍රධාන ගණකාධිකාරී හා /ගණකාධිකාරීවරුන්,
සහකාර අධ්‍යක්ෂ - මෙනේරිපිටිය /අටුළුගම අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථාන,

**පුහුණු වැඩසටහන් / වැඩමුළු හා සම්මන්ත්‍රණ සංවිධානයට අදාල දීමනා**

උක්ත කරුණට අදාලව මවිසින් නිකුත් කරන ලද පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක සබර/2014/02 හා බැඳේ.

02. එකී චක්‍රලේඛයෙන් පැන නැගී ඇති ගැටළු සම්බන්ධව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු ඇතුළු විෂය අධ්‍යක්ෂවරු විසින් කරන ලද ඉල්ලීම් සලකා බලා ප්‍රධාන ලේකම්තුමාගේද අනුමැතිය මත, සංශෝධිත මෙම නව චක්‍රලේඛය නිකුත් කරමි. ඒ අනුව මවිසින් 2014.01.08 දිනැතිව නිකුත් කල සබර/2014/02 චක්‍රලේඛය අවලංගු වන අතර, වහාම ක්‍රියාත්මක වන පරිදි මෙම නව සංශෝධිත චක්‍රලේඛය පුහුණු වැඩ සටහන්, වැඩමුළු හා සම්මන්ත්‍රණ සඳහා වියදම් දැරීමට වලංගු වන බව කාරුණිකව දන්වමි.

03. අදාල නව සංශෝධිත දීමනා සහ කොන්දේසි හා නියමයන් පහත පරිදි වේ.

| අයිතමයන් | අනුමත කරන ලද සංශෝධිත නව රේටයන් (රුපියල්) |
|---|---|
| **01.** සහභාගිවන්නන් සඳහා දීමනා (දිනකට) | |
| 1.1 විදුහල්පතිවරු හා මණ්ඩලික නිලධාරීන් | 500/- |
| 1.2 ගුරුවරු | 450/- |
| 1.3 කණිෂ්ඨ කාර්ය මණ්ඩලය | 300/- |
| 02. සංවිධානය හා මෙහෙයවීමේ දීමනා - වැඩ මුළු දිනක් සඳහා (එක් අයෙකුට පමණි) | 500/- |

ගරු අමාත්‍යතුමා / Hon.Minister: Office-045-5623222,045-2287306 Residence-045-2222538 Mobile-077-9102001 Fax-045-2228042

අමාත්‍යාංශ ලේකම් / Secretary: Office-045-2223015 Residence-045-2232985 Mobile-071-4402000 email-msweerasooriya@gmail.com

කාර්යාලය / Office: නවනගරය,රත්නපුර. Newtown,Rathnapura. Office-045-2222542 Fax-045-2228042

| | |
|---|---|
| 03. අධීක්ෂණ දිමනා - වැඩමුළු දිනක් සදහා ( එක් අයෙකුට පමණි ) | 400/- |
| 04. පුහුණු මධ්‍යස්ථානාධිපති දිමනා - වැඩ මුළු දිනක් සදහා ( එක් අයෙකුට පමණි ) | 300/- |
| 05. සහාය කාර්ය මණ්ඩල දීමනා - වැඩමුළු දිනක් සදහා (උපරිම දෙදෙනෙකු සදහා) | |
| ආයතන කටයුතු | 300/- |
| ගිණුම් කටයුතු | 300/- |
| 06. යතුරු ලේඛක / පරිගණක ක්‍රියාකරු / ලිපි පරිගණක ගත කිරීමේ දීමනා (වැඩ මුළු දිනක් සදහා) (එක් අයෙකුට පමණි) | 200/- |
| 07. කාර්යාල කාර්ය සහයක / කම්කරු දිමනා - (වැඩමුළු දිනක් සදහා) ( එක් අයෙකුට පමණි ) | 150/- |
| 08. සම්පත්දායක දිමනා - පැයකට දීමනා | |
| 1. විශ්ව විද්‍යාලවල මහාචාර්ය / ආචාර්යවරුන් / කථිකාචාර්යවරුන් සදහා | 1250/- |
| 11. ජාතික අධ්‍යාපන ආයතනයේ කථිකාචාර්යවරුන් සදහා | 1000/- |
| 111.දීප ව්‍යාප්ත සේවාවල විශේෂ ශ්‍රේණියේ හා පළමු පන්තියේ නිලධාරීන් සදහා | 800/- |
| 1v. දීප ව්‍යාප්ත සේවාවල 11/111,නිලධාරීන් හා ගුරු අධ්‍යාපනඥ සේවයේ . . නිලධාරීන් | 600/- |
| v. ඉහත 1,11,111, 1v කාණ්ඩ වලට අයත් නොවන නිලධාරීන් සදහා | 450/- |
| 09. ආහාර පාන සහ සංග්‍රහ කටයුතු සදහා | |
| 1. එක් අයෙකුට එක් දිනක් සදහා | 350/- |
| 11 එක් දිනකට වඩා වැඩි දින ගණනක් පවත්වනු ලබන වැඩමුළු / වැඩ සටහන්/සම්මන්ත්‍රණ සදහා | 475/- |
| 10. ලිපි ද්‍රව්‍ය - එක් වැඩ මුළුවක සහභාගීවන්නෙකු සදහා | 50/- |

106

<u>කොන්දේසි සහ අදාල වන නියමයන්</u>

( අ) ඉහත 01 අයිතමය යටතේ දැක්වෙන රේට් ගණන් යටතේ කෙරෙන ගෙවීම් වලදී එම දීමනා හැර සංයුක්ත දීමනා, ගමන් වියදම්, අතිකාල දීමනා ආදී වෙනත් කිසිදු දීමනාවක් නොගෙවිය යුතුය.

(ආ) 02,03,04,06,07 අයිතමයන් හී සඳහන් දීමනා ගෙවිය හැක්කේ එක් වැඩමුළුවක් සඳහා එක් අයෙකුට පමණි.

(ඇ) ඉහත අංක 08 හි සඳහන් සම්පත්දායක දීමනා ගෙවීමේදී එම දීමනාව හැර වෙනත් කිසිදු දීමනාවක් නොගෙවීමේ පදනම මත කටයුතු කල යුතුය.

(ඈ) ඉහත අංක 08 හි සඳහන් පරිදි සම්පත්දායක දීමනා ගෙවීමේදී සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා දිනකට පැය 03 ක හා සතියකට පැය 06 ක උපරිමයකට යටත්ව ගෙවීම් කල හැකිය.අනිකුත් බාහිර සම්පත්දායකයින් සඳහා දිනකට පැය 08 ක උපරිමයකට යටත්ව සම්පත්දායක දීමනා ගෙවිය හැකිය.

(ඉ) සම්පත්දායක මණ්ඩලයක් එකම විට සම්පත්දායකත්වය සපයන අවස්ථාවලදී ඉහත (ඈ) ඡේදයේ සඳහන් පැය ගණන් වල උපරිමයට යටත්ව 08 අයිතමයේ සඳහන් සම්පත්දායක දීමනා වලින් අර්ධය බැගින් වන සේ ඒ ඒසම්පත්දායකයින් හට ගෙවිය හැකිය.

(ඊ) මීට අමතරව පුහුණු වැඩ සටහන්, හා වැඩමුළු හා සම්මන්ත්‍රණ සඳහා අනුමැතිය හා අත්තිකාරම් සඳහා අනුමැතිය පහත පරිදි ලබාගත යුතුය.

| අංකය | වැඩමුළු /පුහුණු/සම්මන්ත්‍රණ | නිර්දේශය | අනුමැතිය |
|---|---|---|---|
| 01. | රු.100000/- දක්වා | විෂයභාර මාණ්ඩලික නිලධාරි | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ |
| 02. | රු.100000/- වැඩි | පළාත්.අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් | ප්‍රධාන ලේකම් |

උ) මීට අමතරව පුහුණු/සම්මන්ත්‍රණ / වැඩමුළු සඳහා වියදම් දැරියයුතු පහත අයිතම සඳහාද නියමිත ගාස්තු ඇස්තමේන්තුවට ඇතුලත් කර අනුමැතිය ලබා ගතයුතුය.

1. තැපැල් ගාස්තු .
2. ඉන්ධන වියදම් (අදාල කි.මී.ගණන අනුව නියමිත හා අනුමත වියදම්)
3. නේවාසික හා දේශනශාලා ගාස්තු (සාමාන්‍ය හා වායු සමීකරණය සහිතව හා ලබාදෙන පහසුකම් අනුව රජයේ අනුමත ගාස්තු)
   *( රජයේ පාසල් වල හා ප්‍රජා ශාලා වැනි පොදු ආයතන වලට ශාලා ගාස්තු ගෙවිය නොහැකිය)*
4. සහතික පත්‍ර මුද්‍රණය.
5. විශේෂ ප්‍රායෝගික වැඩ සටහන් සඳහා අධ්‍යාපන උපකරණ හා රසායනික ද්‍රව්‍ය වලට අදාල නියමිත වියදම්.

(ඍ) අධ්‍යයන චාරිකා / ක්ෂේත්‍ර චාරිකා සඳහා වෙනම ඇස්තමේන්තු අනුමත කරවා ගත යුතුය.

(එ) ඉහත පුහුණු වැඩමුළු, වැඩසටහන්, සම්මන්ත්‍රණ සඳහා අදාල ඉහත සියළු ගෙවීම් කිරීමේදී මධ්‍යම රජය, පළාත් සභාව, ගරු ආණ්ඩුකාරතුමා අනුමත කර ඇති උක්ත දීමනා රේටයන් හා ඊට අදාල චක්‍රලේඛ වලට අනුකූලව / අදාලව කටයුතු කල යුතුය. මෙම අනුමත දීමනා / වියදම් ඉක්මවා යම් ගෙවීමක් කිරීමට සිදුවන්නේ නම් එම ගෙවීම කිරීමට ප්‍රථම ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගතයුතුය. සියළුම ගෙවීම් රාජ්‍ය මුදල් රෙගුලාසි අනුව සිදුකල යුතුය.

(ඒ) පුහුණු වැඩමුළු වලට (බාහිර සම්පත්දායින් හැර) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අනුයුක්ත නිලධාරීන් විසින් තමන්ගේ දේශන,වැඩමුළු වලට අදාලව ඉදිරිපත් කරන දේශනයට අදාල අත් පත්‍රිකා - මොඩියුල සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අනුමැතිය ලබා ගතයුතුය.

(ඔ) වියදම් ඇස්තමේන්තු අනුමැතියට ඉදිරිපත් කිරීමේදී පහත සඳහන් සහතිකය අදාල මාණ්ඩලික නිලධාරීන් විසින් ඇස්තමේන්තුවේ පැහැදිලිව සඳහන් කල යුතුය.

*" මෙම වැය ඇස්තමේන්තුවට අදාල වියදම් සබර /2014 /14 චක්‍රලේඛය අනුව හා රජයේ අනුමත චක්‍රලේඛ වලට හා රජයේ මුදල් රෙගුලාසි වලට අනුකූලව සකස් කර ඇති බව සහතික කරමි "*

03. මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන හා උපදෙස් තරයේ පිළිපදින ලෙස මින් අවධාරණය කරමි.

මහින්ද එස්. වීරසූරිය
ලේකම්
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව
නව නගරය - රත්නපුර.

මහින්ද එස්.වීරසූරිය,
ලේකම්,
අධ්‍යාපන,තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.

පිටපත් 01. ප්‍රධාන ලේකම් - සබරගමුව පළාත් සභාව - දැ.පි.
02. පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ සියළුම මාණ්ඩලික නිලධාරීන් - දැ.පි.